**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

---

නිවේදන අංකය : 03 | WW/L/21/11/25/03

වර්ණය : ඇම්බර්

## තද වැසි පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2021 නොවැම්බර් මස 26 වන දින පෙ.ව. 10.00 වන තෙක් වලංගු වන පරිදි
2021 නොවැම්බර් මස 25 වන දින පෙ.ව. 10.00 ට නිකුත් කරන ලදී.

---

**නැගෙනහිර, ඌව, සබරගමුව, මධ්‍යම, වයඹ, බස්නාහිර සහ දකුණු පළාත් සහ පොලොන්නරුව දිස්ත්‍රික්කය සඳහා**

### සැලකිලිමත් වන්න!

දිවයිනට ගිනිකොණ දෙසින් නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති පහළ වායුගෝලයේ කැළඹිලි ස්වභාවය, අඩු පීඩන තත්ත්වයක් දක්වා වර්ධනය වී දැනට දිවයිනට නැගෙනහිර දෙසින් ස්ථානගතව පවතී.

### වැසි තත්වය:

මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් නැගෙනහිර, ඌව, සබරගමුව, මධ්‍යම, වයඹ, බස්නාහිර සහ දකුණු පළාත් වලත් පොලොන්නරුව දිස්ත්‍රික්කයෙත් ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි ඇතිවිය හැක.

දිවයිනේ සෙසු ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මි.මී. 75 ට වැඩි තරමක තද වැසි ද ඇතිවිය හැක.




| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
|---|---|---|